# කතෝලික චින්තන විප්ලවය

දෙවියන් වහන්සේලා හා විද්‍යා ගැන අපි සාකච්ඡා කරමින් සිටියෙමු. මෙහි දී විවිධ විද්‍යා පමණක් නොව විවිධ දැනුම් පද්ධතීන් ද අදාළ වෙයි. ඒ ඒ දෙවියන් වහන්සේලා ද දැනුම මෙන් ම ඒ ඒ සමාජයෙහි නිර්මාණ වෙයි. ඒ සියල්ල යම් චින්තනයක නිර්මාණය වූ දෑ වෙයි. මේ නිර්මාණ හේතුවෙන් යථා කාලයේ දී චින්තනය ද වෙනස් වෙයි. වෙනස් නොවන කිසිවක් මෙදියත නැත යන්න සිංහල බෞද්ධ චින්තනයෙහි කියැවෙන්නක් වෙයි. එහෙත් සිංහල බෞද්ධ චින්තනය වුව ද කාලයත් සමග වෙනස් වෙයි. එසේත් නැතහොත් වෙනස්වීම පදනම් කරගනිමින් කාලය යන සංකල්පය නිර්මාණය වී ඇතැයි අපට කිව හැකි ය.

එසේ නම් දැනුම යම් චින්තනයක නිර්මාණය වන්නේ ය යන්නෙහි තේරුම කුමක් ද? චින්තනය ද වෙනස් වුව ද යම්කිසි කාලයක දී කාල පරිච්ඡෙදයක දී බල පැවැත්වෙන චින්තනයක් වෙයි. ඒ ඒ කාලවල දී අදාළ චින්තනයෙහි දැනුම නිර්මාණය වන බව ඉහත සඳහන් ප්‍රකාශයෙහි තේරුම වෙයි. ඒ ඒ දෙවියන් වහන්සේ වුව ද නිර්මාණය වන්නේ ඒ ඒ චින්තනයෙහි බැවින් අදාළ චින්තනයෙහි ආවේණික ලක්‍ෂණ දෙවියන් වහන්සේ කෙරෙහි ද දැකිය හැකි ය.

කතෝලික චින්තනයෙහි දෙවියන් වහන්සේ යුදෙව් චින්තනයෙහි දෙවියන් වහන්සේ මෙන් වියුක්ත දෙවියන් වහන්සේ කෙනෙක් නො වෙයි. වඩාත් ම වියුක්ත දෙවියන් වහන්සේ ඇත්තේ යුදෙව් හා බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනවල ය. කතෝලික චින්තනයෙහි දෙවියන් වහන්සේ ද යුදෙව් චින්තනයෙහි දෙවියන් වහන්සේ ද, යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි දෙවියන් වහන්සේ ද එකම නමින් එනම් යෙහෝවා දෙවියන් වහන්සේ ලෙස කඳුන්වනු ලැබුව ද ඒ ඒ දෙවියන් වහන්සේ අතර වෙනස්කම් තිබෙනු අපි දුටුවෙමු.

යුදෙව් චින්තනයෙහි යෙහෝවා දෙවියන් වහන්සේ නම් සංකල්පය ක්‍රිස්තුස් වහන්සේ අතින් යම් පමණකට වෙනස් කරනු ලැබිණි. ක්‍රිස්තුස් වහන්සේ තමා දෙවියන් වහන්සේගේ පුත්‍රයා යැයි කී විට මුළු යුදෙව් චින්තනයම සෙළවිණි. යුදෙව්වන් ක්‍රිස්තුස් වහන්සේට විරුද්ධ වීම පුදුමයක් නො වේ. එහෙත් අපට ප්‍රශ්නයක් වන්නේ ක්‍රිස්තුස් වහන්සේ එවැනි ප්‍රකාශයක් කෙළේ කෙසේ ද කුමක් අරභයා ද යන්න ය. මුළු ලෝක ඉතිහාසය ම වෙනස් කිරීමට තුඩු දුන් මේ ප්‍රකාශ ය පිළිබඳ ව අප යම් පමණකින් හෝ එවැනි අධ්‍යයනයක් කළ යුතු ය. මෙහි සඳහන් වන්නේ එවැනි අධ්‍යයනයකට මුල පිරීමක් මිස පූර්ණ අධ්‍යයනයක ප්‍රතිඵල නො වේ.

ක්‍රිස්තුස් වහන්සේ දෙසූ දෑ අද ලෝකයේ වැඩිම දෙනා පිළිගන්නා ආගමේ, එනම් කතෝලික ආගමේ හරය වෙයි. විවිධ ක්‍රිස්තියානි භක්තියන් ද එකතු කළ විට ක්‍රිස්තුස් වහන්සේ දෙසූ දෑ පිළිගන්නා පිරිස අති විශාල වෙයි. එතරම් විශාල පිරිසක් විසින් පිළිගනු ලැබීමට තරම් ක්‍රිස්තුස් වහන්සේ කියා ඇත්තේ කුමක් ද? උන්වහන්සේ ලෝකයාට ඉගැන්වූ කාලය අවුරුදු දෙකක තරම් සුළු වූවකි. බුදුන් වහන්සේ අවුරුදු හතළිස් පහක කාලයක් ලෝකයාට ධර්ම දේශනා කළ බව අප අමතක නොකළ යුතු ය.

අවුරුදු දෙකක පමණ සුළු කාලයක් දේශනා කිරීමෙහි යෙදුණු අයකු කියා ඇති දෙය ප්‍රමාණාත්මක වශයෙන් ගත්කළ සුළු විය යුතු බව අවධාරණය කිරීමේ අවශ්‍යතාවක් නැත. එසේ නම් ලෝකයා උන්වහන්සේ පිළිගත්තේ කිනම් දේශනයක් නිසා ද? ඒ කන්ද උඩ දේශනාව ද? එසේත් නැත්නම් දිළින්දන් වෙත දැක් වූ ආදරය ද? මේ ආදරය යන්න ඒ අර්ථයෙන් සිංහල බෞද්ධ සංස්කෘතියෙහි නැත. බුදුන් වහසේ ලෝකයාට ආදරය කෙළේ යැයි අපි නො කියමු. අපි බුදුන් වහන්සේගේ මහා කරුණාව, මෛත්‍රිය ගැන කියමු. එහෙත් මෑතක සිට විද්‍යුත් නාලිකාවලින් තොර තෝංචියක් නැතිව කතාකරණ නිවේදික නිවේදිකාවන්ට ආදරය යන්න නැතිව ම බැරි වදනක් වී ඇත. ඔවුහු ර්නියා ආදරණීය දවසක් ගැන ද ඇතැම් විට කතාකරති. ඔවුන් එලෙස සීමිත වචන කිහිපයක කොටුවන්නේ ඔවුන්ගේ ශබ්දකෝශවල ඇති අඩුවක් නිසා බව පැහැදිලි ය.

ඒ කෙසේ වෙතත් ආදරය, දයාව, කරුණාව, මෛත්‍රිය ආදී වචන ආගමික ශාස්තෘන් වහන්සේ විසින් යොදාගනු ලැබ ඇත. කන්ද උඩ දේශනාව ද අළුත් දෙයක් කියා දෙන්නක් නො වේ. භගවත් ගීතයෙහි මෙන් ගැඹුරු දහමක් ක්‍රිස්තුස්

© Prof. Nalin De Silva

වහන්සේ කිසි තැනක දේශනා කර ඇති බවක් කිව නො හැකි ය. එමෙන් ම ක්‍රිස්තුස් වහන්සේට එකල බටහිර ආසියාවේ තිබූ දැනුම වුව ද යම් අධ්‍යාපනයක් ඔස්සේ ලබාගැනීමට අවස්ථාවක් නොවූ බව පැහැදිලි ය.

එසේ තිබියදීත් ලෝකයා ක්‍රිස්තුස් වහන්සේ දෙසට කල්ගත වීමෙන් පසුව වුවත් ආකර්ෂණය වූයේ කෙසේ ද? මා සිතන ආකාරයට ක්‍රිස්තුස් වහන්සේ ලෝකයාට ආකර්ෂණය වූයේ උන්වහන්සේ තමන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බවත් තමන් දෙවියන් වහන්සේ බවත් ප්‍රකාශ කිරීම ය. උන්වහන්සේට එවැනි අදහසක් කෙසේ ලැබිණි දැයි යන්න සාකච්ඡා කිරීම පසුවට කල් තබා උන්වගන්සේගේ දහම ජනප්‍රියවීම ගැන තවත් කරුණක් දෙකක් කිව යුතු ය.

ක්‍රිස්තුස් වහන්සේ යුදෙව්වන් අතර පිළිගැනීමට ලක් නො වී ය. යුදෙව්වෝ උන්වහන්සේට හද පත්ලෙන් ම වෛර කර ඇති බව පැහැදිලි ය. යුදෙව්වන් අතර සිටියෝ අනාගත වක්තෘවරු ය. අනාගතය හැන කී අනාගත වක්තෘවරු කිසිවකුවත් තමන් දෙවියන් වහන්සේගේ පුත්‍රයන් බවක් නො කීවෝ ය. ක්‍රිස්තුස් වහන්සේ පමණක් එසේ කීහ. එතැනින් නොනැවතී තමන් දෙවියන් වහන්සේ බව ද කීවේ ය. ක්‍රිස්තුස් වගන්සේ වෙන කුමක් දේශනා කළත් උන්වහන්සේගේ ම වූ එතකුකිරීම වූයේ මේ දේව පුත්‍ර කතාව ය.

යුදෙව්වෝ උන්වහන්සේට විරුද්ධව රෝම පාලයකන්ට කරුණු කීවෝ ය. හෙරෝද් රජු ඇතුළු රෝම පාලකයන්ට ක්‍රිස්තුස් වහන්සේ තර්ජනයක් නො වී ය. රෝමයන්ට ක්‍රිස්තුස් වහන්සේට දඬුවම් කිරීමේ අවශ්‍යතාවක් නො වී ය. උන්වහන්සේට දඬුවම් පැමිණවීමට අවශ්‍ය වූයේ යුදෙව්වන්ට ය. අන්තිම මොහොත දක්වා ම යුදෙව්වෝ ක්‍රිස්තුස් වහන්සේට මරණීය දණ්ඩනය, එනම් එකල ක්‍රියාත්මක වූ ආකාරයට කුරුසියේ ඇණ ගැසීම, පැනවීමට පිලාත් ආණ්ඩුකාරයාට බල කර සිටියහ. ක්‍රිස්තුස් වහන්සේ කුරුසියේ ඇණ ගැසීමට ලක්වූයේ රෝමයන්ගේ අවශ්‍යතාවකට නොව යුදෙව්වන්ගේ බලවත් ඉල්ලීමට ය.

යුදෙව්වන් අතර ක්‍රිස්තුස් වහන්සේ ජනප්‍රිය නො වී ය. උන්වහන්සේගේ ගෝලයන් වූයේ ධීවරයන් කිහිප දෙනෙකි. යුදෙව්වන් අතර ක්‍රිස්තුස් වහන්සේට අනුගාමිකයන් නොසිටින්නනටත් උන්වහන්සේ මරණයට පත්කිරීමෙන් පසු රෝම අධිරාජ්‍යය තම නිල ආගම ලෙස ක්‍රිස්තුස් වහන්සේගේ ආගම පිළිගැනීමටත් ඉන්පසු ඒ යුරෝපයේ පැතිරීමටත් පසුව යුරෝපීය අධිරාජ්‍යය යටතේ ලොවට ම ඒ ලබාදීමටත් හේතු වූ කරුණු කවරේ ද?

ක්‍රිස්තුස් වගන්සේට එකල පලස්තීනය හා අවට විසූ යුදෙව්වන්, විරුද්ධ වන්නට ඇත්තේ උන්වහන්සේ තමන් දෙවියන් වහන්සේ බවත් මෙලොවට උන්වහන්සේගේ පුත්‍රයා ලෙසත් පැමිණි බවත් ප්‍රකාශ කිරීමෙන් පසුව විය යුතු ය. ඒ පිළිබඳ සාක්ෂියක් අපට බයිබලයෙන් සොයා ගැනීමට නොහැකි යැයි කෙනකු කියනු ඇත. එහෙත් යුදෙව්වන් රෝමයන්ට කියා ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේ බලවත් වීමට උත්සාහ කරන බවත් උන්වහන්සේගේ ව්‍යාපෘතිය රජවීමට බවත් ය. ක්‍රිස්තුස් වහන්සේ රජවීමට උත්සාහ දැරී නම් රෝමයන් ඒ පිළිබඳ ව නිසි අයුරින් කටයුතු කරනු නිසැක ය. අනෙක් අතට එවැනි ප්‍රයත්නයක් වී නම් යුදෙව්වන් ඒ පිළිබඳ ව පැමිණිලි කරන තෙක් රෝම පාලකයන් බලා නොසිටිනු ඇත. එහෙත් රෝම පාලකයන් ඒ රජවීම තුට්ටුවකටවත් තකන ලද බවක් නො පෙනේ. කලින් කී පරිදි රෝම පාලකයන්ට ක්‍රිස්තුස් වහන්සේ තර්ජනයක් නො වී ය.

එයින් පෙනී යන්නේ යුදෙව්වන් ක්‍රිස්තුස් වහන්සේ රජවීමට බලාපොරොත්තු වන බව කියා ඇත්තේ උන්වහන්සේගේ දේව පුත්‍ර සංකල්පය හා දේව සංකල්පය හේතුකොටගෙන බව ය. තමන් දෙවියන් වහන්සේ බව ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශ කරන විට එක් පැත්තකින් ඉන් අදහස් කරන්නේ තමන් ස්වර්ග රාජ්‍යයේ රජු බව ය. එයත් රාජ්‍යත්වයක් වෙයි. ස්වර්ග රාජ්‍යය හා මෙලොව (රෝම) රාජ්‍යය යනු එකක් නොව දෙකක් බව ක්‍රිස්තුස් වහන්සේට ප්‍රකාශ කිරීමට සිදු වී ඇති බව පෙනී යයි. සීසර්ට (රජුට) අයත් දේ සීසර්ටත් දෙවියන්ටත් අයත් දේ දෙවියන්ටත් ය යන සුප්‍රසිද්ධ ප්‍රකාශය මේ අරභයා කියැවුණු එකක් වෙයි.

ක්‍රිස්තුස් වහන්සේට තමන් දෙවියන් වහන්සේගේ පුත්‍රයා ය යන සංකල්පය කෙසේ ලැබිණි දැයි නිශ්චිත ව කිව නො හැකි ය. එවැනි සංකල්පයක් යුදෙව් සංස්කෘතියෙහි තිබී නැත. එමෙන් ම එවැනි සංකල්පයක් යුදෙව් සංස්කෘතියෙහි පැන නැගීමට ඇති ඉඩකඩ ද ඉතා විරල ය. ව්‍යක්ත දෙවියන් වහන්සේ කෙනකුගේ පුත්‍රයා යන සංකල්පය යුදෙව්

සංස්කෘතියෙන් පැන නැගිය හැකි යැයි සිතිය නො හැකි ය. බොහෝ විට මේ සංකල්පය ක්‍රිස්තුස් වහන්සේට වෙනත් සංස්කෘතියකින් ලැබුණු එකක් විය හැකි ය.

ඇතැමුන්ට අනුව ක්‍රිස්තුස් වහන්සේ දඹදිවට පැමිණ ඇත. එහි දී උන්වහන්සේ විෂ්ණුගේ අවතාර පිළිබඳ සංකල්පය දැන ගන්නට ඇත. විෂ්ණු යනු බ්‍රහ්මන්ගේ ත්‍රිමූර්තියෙන් එකක් පමණක් වෙයි. ඒ ත්‍රිමූර්තියෙන් විෂ්ණු දෙවියන් මනුෂ්‍ය ලෝකයට විවිධ අවතාරවලින් පැමිණ ඇත. පසු කාලීන ව දඹදිව විකාශය වූ සංකල්ප අනුව බුදුන් වහන්සේ ද විෂ්ණුගේ දස අවතාරවලින් එකකි. විෂ්ණු බ්‍රහ්මන්ගේ ත්‍රිමූර්තියෙන් එකක් බැවින් විෂ්ණුගේ අවතාර යනු බ්‍රහ්මන්ගේ අවතාර වෙයි. බ්‍රහ්මන් ඉදහිට මනුෂ්‍යාත්මයක් හෝ වෙනත් ආත්මයක් හෝ ලබාගෙන යහපත පිණිස මනුෂ්‍ය ලෝකයට පැමිණෙන්නේය යන විශ්වාසය වෛදිකයන් අතර විය.

ක්‍රිස්තුස් වහන්සේ දඹදිවට පැමිණියත් නැතත් මේ සංකල්පය උන්වහන්සේට ලැබෙන්නට ඇත. වෙළෙන්දන්ගේ මාර්ගයෙන් හෝ දේශ ගවේෂකයන්ගේ මාර්ගයෙන් හෝ මේ සංකල්පය දඹදිවෙන් පලස්තීන ප්‍රදේශයට නොලැබීමට හේතුවක් නැත. බොහෝ විට ක්‍රිස්තුස් වහන්සේ ඒ සංකල්පය එලෙස ලබාගත්තා විය හැකි ය. ඒ අවතාර සංකල්පය යුදෙව්වන් විසින් ප්‍රතික්ෂේප කරන්නට ඇත්තේ තම දෙවියන් වහන්සේ වියුක්ත දෙවියන් වහන්සේ කෙනකු වූ බැවිනි. වියුක්ත දෙවියන් වහන්සේ කෙනකු මිනිස් සිරුරක් සහිතව මෙලොවට පැමිණීමට යුදෙව් සංස්කෘතියෙහි ඉඩක් නැත. එහෙත් ක්‍රිස්තුස් වහන්සේට මේ සංකල්පය අමා දහරාවක් වන්නට ඇත.

ක්‍රිස්තුස් වහන්සේ විෂ්ණු අවතාර සංකල්පය තම සංස්කෘතියට අවශෝෂණය කරගෙන ඇත්තේ යුදෙව් චින්තනය ද වෙනස් කරමිනි. යුදෙව් චින්තනයේ වියුක්ත බව ද ඉන්පසු අඩු වී ඇති බව පැහැදිලි ය. වියුක්ත දෙවියන් වහන්සේ කෙනකුට තමන් උන්වහන්සේගේ පුත්‍රයා යැයි කියමින් මෙලොව මිනිස් වේශයකින් ඉන්ද්‍රිය ගෝචර ව පෙනී සිටිය නො හැකි ය. ක්‍රිස්තුස් වහන්සේ තමන් කෙළේ කුමක් ද යන්න දැන සිටියේ ද නැද්ද යන්න මෙහි දී ප්‍රශ්නයක් නො වෙයි. උන්වහන්සේ පැහැදිලිව ම චින්තන විප්ලවයක් කෙළේ ය. අපි එය කතෝලික චින්තන විප්ලවය ලෙස දකිමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva